

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

சட்ட வரைஞர் திணைக்களம்

Legal Draftsman's Department

2022

කාර්ය සාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

Performance Report

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

சட்ட வரைஞர் திணைக்களம்

Legal Draftsman's Department

2022

2022 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය: 230

අන්තර්ගතය

පරිච්ඡේදය 01	-	ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය
පරිච්ඡේදය 02	-	ප්‍රගතිය හා ඉදිරි දැක්ම
පරිච්ඡේදය 03	-	වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය
පරිච්ඡේදය 04	-	කාර්ය සාධන දර්ශක
පරිච්ඡේදය 05	-	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය
පරිච්ඡේදය 06	-	මානව සම්පත් පැතිකඩ
පරිච්ඡේදය 07	-	අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.3 ප්‍රධාන කාර්යයන්

1.4 සංවිධාන සටහන

1.1 හැඳින්වීම

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව "ඒ" ශ්‍රේණියේ රාජ්‍ය දෙපාර්තමේන්තුවකි. අමාත්‍යාංශ විෂයයන් හා කාර්යයන් පිළිබඳ අංක 2187/27 හා 2020.08.09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව අධිකරණ අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ කටයුතු කරයි.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යභාරය වනුයේ, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද තීරණ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, විවිධ විෂයයන් පිළිබඳ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ලිඛිත නීති බවට පරිවර්තනය කිරීම වේ. එසේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීමේ කාර්යාවලියේදී, දෙපාර්තමේන්තුව විසින්, නව නීති පැනවීම සඳහා පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම, පවත්නා නීති සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම සහ ආණ්ඩුවේ විවිධ අමාත්‍යාංශවලින් ඉදිරිපත් කරන උපකාරක නීති ප්‍රතිශෝධනය කිරීම සිදුකරයි. පනත් කෙටුම්පත් සමාලෝචනය කිරීම සඳහා වන පාර්ලිමේන්තු තේරීම් කාරක සභා රැස්වීම්වලට සහභාගීවීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේ දී පාර්ලිමේන්තුව සමග සම්බන්ධීකරණය පවත්වා ගනිමින් අවශ්‍ය කටයුතු කිරීම දෙපාර්තමේන්තුවට පැවරී ඇති අනෙකුත් රාජකාරි කටයුතු වේ. මෙම දෙපාර්තමේන්තුව, සියලු රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ද ඇතුළුව ආණ්ඩුවේ සියලු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත සේවා සලසයි. පනත් කෙටුම්පත් සහ උපකාරක නීති සැකසීම සම්බන්ධයෙන් නොයෙකුත් ආණ්ඩුවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට නෛතික උපදෙස් ලබාදීම ද, දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

1.2

දැක්ම

යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීම සඳහා, ආණ්ඩුවේ නොයෙකුත් ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කරමින් ශ්‍රී ලංකා ජනරජයට සහාය වීම

මෙහෙවර

ආණ්ඩුවේ ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීමේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ඊට අදාළ පනත් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන් සම්පාදනය කිරීම

1.3 පනත් කෙටුම්පත් සම්පාදනය කිරීමට අදාළව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කර්තව්‍ය වනුයේ:-

(1) නව නීති පැනවීම සඳහා ද පවත්නා නීති සංශෝධනය කිරීම සඳහා ද භාෂාත්‍රයෙන් පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම;

(2) උපකාරක නීති භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම සහ (අවශ්‍ය අවස්ථාවලදී) උපකාරක නීති කෙටුම්පත් කිරීම;

(3) නීති සම්පාදනය හා සම්බන්ධ පාර්ලිමේන්තු රාජකාරි ඉටු කිරීම;


(4) අවශ්‍ය අවස්ථාවල දී පළාත් සභා සඳහා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම;

(5) පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් (සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත්) භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම.

පනත්, උපකාරක නීති, සහ පළාත් සභා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීමේදී ඒ සම්බන්ධව අවශ්‍ය වන නෛතික උපදෙස් ලබා දීම ද මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.

මෙම දෙපාර්තමේන්තුවේ විශේෂ ලක්ෂණය වන්නේ, එයටම සීමා වූ වැඩසටහනක් නොතිබීම යි. අමාත්‍ය මණ්ඩලය විසින් නියමිත ප්‍රතිපත්ති අනුමත කිරීමෙන් පසුව, ආණ්ඩුවේ අමාත්‍යාංශවල හා එම අමාත්‍යාංශ යටතේ ඇති විවිධ දෙපාර්තමේන්තුවල ව්‍යවස්ථා සම්පාදන අවශ්‍යතා මත දෙපාර්තමේන්තුවේ වැඩසටහන සකස් වීම ඊට හේතුවයි. එබැවින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය, යම් නිශ්චිත වර්ෂයක් මුළුල්ලේ ප්‍රාථමික නීති, නීති සංශෝධන හා උපකාරක නීති සම්බන්ධයෙන් අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හා එම ඉල්ලීම් සාර්ථකව නිම කිරීම යන පදනම මත සකස් වී ඇත. දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වන නීති සම්පාදනයෙහි විෂය පථයට ඇතුළත් වන කවර ආකාරයක හෝ වූ නීති, එය ඉල්ලා සිටින අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට මුදා හැරීමට පෙර භාෂා තුනෙන් ම සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

1.4 සංවිධාන සටහන


නීති කෙටුම්පත් සම්පාදක 01
අතිරේක නීති කෙටුම්පත්සම්පාදක- 01
නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක- 05
ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක-08
සහකාර නීති කෙටුම්පත් සම්පාදක–25
ප්‍රධාන ගණකාධිකාරි -01
සහකාර අධ්‍යක්ෂ - 01
ප්‍රධාන භාෂා පරිවර්තක E/S – 1 E/T-1
පරිපාලන නිලධාරි -01
භාෂා පරිවර්තක E/S-13 E/T-11
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි -01
පුස්තකාලයාධිපති - 01
සංවර්ධන නිලධාරි - 02
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර - 01
කළමනාකරන සේවා නිලධාරි
කළමනාකරන සේවා නිලධාරි
ලේඛන සහකාර -20
සංස්කාරක -11 S/4,T/3,E/4
රියදුරු - 10
කාර්යාල සේවක සේවය -14

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2022 කාර්ය සාධන වාර්තාව - 2022.01.01-2022.12.31

	(1)	(2)	(3)	(4)	(5)	(6)	(7)	(8)	* (9)		(10)	* (11)	(12)
	රාජකාරියේ ස්වභාවය	**2022.01.01**දිනට කෙටුම්පත් කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් භාරදී නීතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් සංඛ්‍යාව (ඉදිරියට ගෙනා ශේෂය)	**2022.01.01** දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව (ඉදිරියට ගෙනා ශේෂය)	මෙම වර්ෂය තුළ පාර්ශ්වයන් වෙතින් ලැබුණු නව ඉල්ලීම් සංඛ්‍යාව	පසුගිය වර්ෂ වල හා මෙම වර්ෂයේදී භාෂාත්‍රයෙන් කෙටුම්පත් කර අවසන් කර එහෙත් නැවත වරක් සංශෝධන සිදුකිරීම සඳහා ලද ඉල්ලීම් සංඛ්‍යාව	එකතුව (2+3+4+5)	**2022.12.31** දිනට කෙටුම්පත් සකස් කර භාෂාත්‍රයෙන් අදාළ පාර්ශ්වයන් වෙත ලබා දුන් සංඛ්‍යාව (කිහිපවරක් භාෂාත්‍රයෙන් සකස් කර අදාළ පාර්ශ්වයන් වෙත භාරදුන් අවසන් කෙටුම්පත්වල ඒ ඒ වාරයන් සියල්ලම මෙහි ඇතුළත් වේ.)	දීර්ඝ කාලීනව උපදෙස් නොමැතිව වසන ලද ගොනු	**2022.12.31** දිනට කෙටුම්පත් කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් භාරදී නීතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් සංඛ්‍යාව		එකතුව (7+8+9)	**2022.12.31** දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව	ප්‍රගතිය (ප්‍රතිශතයක් % වශයෙන්) ((10/6)*100)
									**නීතිපති	අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු			
1	පනත් කෙටුම්පත් කිරීම (මූලික හා සංශෝධන නීති)	**202**	**29**	**56**	**11**	**298**	**53**	**79**	**23**	**112**	**267**	**31**	**90%**
2	පෞද්ගලිකමන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත්	**13**	**13**	**22**	**2**	**50**	**10**	**0**	**28**		**38**	**12**	**76%**
3	උපකාරක නීති ප්‍රතිශෝධනය	**125**	**48**	**210**	**33**	**416**	**210**	**26**	**123**		**359**	**57**	**86%**
4	පළාත් සභා ප්‍රඥප්ති	**9**	**1**	**1**	**0**	**11**	**0**	**0**	**11**		**11**	**0**	**100%**
	එකතුව	**349**	**91**	**289**	**46**	**775**	**273**	**105**	**297**		**675**	**100**	**87%**

* 9, 10 තීරුවලට අදාළ පැහැදිලි කිරීම් පසුපිටේ දක්වා ඇත.

** මෙම දෙපාර්තමේන්තුව විසින් සෘජුවම නීතිපතිවරයා වෙත යොමු කරනු ලබන්නේ මූලික හා සංශෝධන පනත් කෙටුම්පත් පමණි.

***පැහැදිලි කිරීම**

වගුවේ තීරු අංක (9) - කෙටුම්පත් කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් භාර දී නීතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් සංඛ්‍යාව සහ (11) - කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව

මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබෙන ඉල්ලීම් අතුරින් ඇතැම් ඉල්ලීම්වලට අදාල කෙටුම්පත් මෙම දෙපාර්තමේන්තුව විසින් වැඩ අවසන් කොට අවසාන කෙටුම්පත් ලෙස භාෂාත්‍රයෙන් අදාල උපදෙස් ලබා දෙන නියෝජ්‍යායතන වෙත භාෂාත්‍රයෙන් යවනු ලැබීමෙන් පසුව ද, එකී නියෝජ්‍යායතන විසින් නිරන්තරයෙන් කරනු ලබන ප්‍රතිපත්ති වෙනස් කිරීමේ හේතුව මත ම නැවතත් වෙනස් කරනු ලැබූ උපදෙස් ද සමග, වැඩිදුරටත් සංශෝධන ඇතුළත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම බහුලව සිදු කෙරේ. එවැනි ඉල්ලීමක් ලැබුණ විට එම ඉල්ලීමට අදාළ කෙටුම්පත අවසාන වශයෙන් සකස් කර තිබුණ ද එය නොසලකා අලුතින් සිදු කරනු ලබන ඉල්ලීමක් මෙන් එම ඉල්ලීම පිළිබඳව නැවත අවධානය යොමු කිරීමට හා ඒ සඳහා කාලය වැය කිරීමට මෙම දෙපාර්තමේන්තුවට සිදු වේ. සම්පූර්ණ කරන ලද කෙටුම්පත් සඳහා එවැනි සංශෝධන සිදුකිරීමට කරනු ලබන ඉල්ලීම් අවසාන කෙටුම්පත භාෂාත්‍රයෙන් යවනු ලැබීමෙන් පසුවද සිදු කරනු ලබන අතර, ඇතැම්විට ඉහත කී කාර්යපටිපාටිය නැවත නැවතත් වාර ගණනාවක්ම ඉටු කිරීමට සිදු වේ. ඒ සඳහා නිදසුන් කිහිපයක් පහත ඉදිරිපත් කර ඇත.

පනත් කෙටුම්පතේ නම	කෙටුම්පත් කර යවා ඇති වාර ගණන (2022.12.31 දිනට)
සත්ව සුබසාධන පනත් කෙටුම්පත	21
ජාතික අක්ෂි බැංකු පනත් කෙටුම්පත	24
ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත් කෙටුම්පත	18

එහෙයින්, මෙම දෙපාර්තමේන්තුව විසින් යම් ඉල්ලීමක් සඳහා අවධානය යොමු කර එය සම්පූර්ණ කර තිබුණ ද, ඉහත දක්වා ඇති හේතුව මත එම ඉල්ලීම තවදුරටත් මෙම දෙපාර්තමේන්තුව විසින් ‘‘කෙටුම්පත් කර අවසන් නොවූ ඉල්ලීමක් ’’ වශයෙන් පිළිඹිබු වේ. ඒ අනුව,

1.පනත් කෙටුම්පත් (මූලික හා සංශෝධන නීති)

කෙටුම්පත් කිරීම අවසන් නොවූ පනත් කෙටුම්පත් (මූලික හා සංශෝධන නීති) ඉල්ලීම් 31 කි. මේවා 2022.12.31 දින හෝ ඊට ආසන්න දිනක ලැබුණු ඉල්ලීම් හෝමෙම දෙපාර්තමේන්තුව විසින් මූලික හෝ සංශෝධිත කෙටුම්පත් යවනු ලැබ නීතිපති හෝ එම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හෝ ආයතනවල උපදෙස් හෝ නිරීක්ෂණ හෝ අවශ්‍ය කැබිනට් අනුමතය 2022.12.31 දින හෝ ඊට ආසන්න දිනක ලැබී ඇති හෝ තවමත් සාකච්ඡා මට්ටමේ පවතින බැවින් මෙම දෙපාර්තමේන්තුව විසින් අවසන් කිරීමට නොහැකි හෝ ඒවා වේ.

2.පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත්

ප්‍රතිශෝධනය කිරීම අවසන් නොවූ ඉල්ලීම් 12 කි. මේවා 2022.12.31 දින හෝ ඊට ආසන්න දිනක ලැබූ ඉල්ලීම් හෝ නීතිපති හෝ අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල උපදෙස් හෝ නිරීක්ෂණ 2022.12.31 දින හෝ ඊට ආසන්න දිනක ලැබී ඇති හෝ තවමත් සාකච්ඡා මට්ටමින් පවතින හෝ ඒවා වේ.

3.උපකාරක නීති ප්‍රතිශෝධනය

ප්‍රතිශෝධනය කිරීම අවසන් නොවූ උපකාරක නීති සම්බන්ධ ඉල්ලීම් 57 කි. මේවා 2022.12.31 දින හෝ ඊට ආසන්න දිනක ලැබූ ඉල්ලීම් හෝ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල උපදෙස් හෝ නිරීක්ෂණ 2022.12.31 දින හෝ ඊට ආසන්න දිනක ලැබී ඇති හෝ තවමත් සාකච්ඡා මට්ටමින් පවතින හෝ ඒවා වේ.

4.පළාත් සභා ප්‍රඥප්ති

ප්‍රතිශෝධනය කිරීම අවසන් නොවූ පළාත් සභා ප්‍රඥප්ති නොමැත.

<u>විශේෂ ජයග්‍රහණ</u>

පැවරෙන කාර්යභාරය හා විෂය පථය පුළුල් වුව ද එම කාර්ය භාරය ඉටු කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ පවතිනුයේ සාපේක්ෂව අඩු කාර්ය මණ්ඩලයකි. එම කාර්ය මණ්ඩලයේ ද පුරප්පාඩු පවතින බැවින්, එවැනි ගැටළු මධ්‍යයේ වුව ද දෙපාර්තමේන්තුව වෙත පැවරෙන කාර්යයන් සාර්ථක හා සඵලදායී ලෙස ඉටු කිරීමට හැකි වීම මෙම දෙපාර්තමේන්තුව ලද විශේෂ ජයග්‍රහණයකි.

<u>අභියෝග</u>

1. ආයතන සංග්‍රහයේ XXXIII පරිච්ඡේදයේ 2.2 අනුව රජයේ නීති සම්පාදන වැඩ සටහන සහ සම්මත කිරීම සඳහා එම පනත් ඉදිරිපත් කරන ප්‍රමුඛතා අනුපිළිවෙළ අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබූ පසුව අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා, එම අමාත්‍ය මණ්ඩල තීරණ ඒ ඒ ලේකම්වරයාට හා නීති කෙටුම්පත් සම්පාදකට ඔවුන්ගේ දැනගැනීම සඳහා දන්වා යැවිය යුතු ය. කෙසේ වුවත් ප්‍රමුඛතා පිළිවෙළ සම්බන්ධව කිසිදු සන්නිවේදනයක් මේ දක්වා සිදු නොවන අතර, නීති සම්පාදනයට අදාළව ප්‍රමුඛතාවන් හඳුනා ගැනීම අපහසු බැවින් ප්‍රමුඛතා පිළිවෙළ හඳුනා ගැනීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අභියෝගයක් වී ඇත.

2. නීති කෙටුම්පත් සම්පාදනයේ පළපුරුදු ජ්‍යෙෂ්ඨ නීති කෙටුම්පත් සම්පාදකවරුන් බොහෝ සංඛ්‍යාවක් පසුගිය කාලය තුළ විශ්‍රාම ගෙන ඇති බැවින්, නවක නිලධාරීන් වැඩි සංඛ්‍යාවක් සහිතව එහි ඉලක්ක සපුරා ගැනීමට සිදුවීම දෙපාර්තමේන්තුවට අභියෝගයක් වී ඇත.

3. දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාවෙන් 57 පුරප්පාඩුව පවතින අතර, එසේ අනුමත තනතුරු සංඛ්‍යාවෙන් 1/3 කට වැඩි සංඛ්‍යාවක් පුරප්පාඩුව තිබිය දී දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු වීම ද අභියෝගයකි. පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින අතර එම ක්‍රියාවලිය සඳහා කල් ගත වේ.

4. දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා බඳවා ගනු ලැබුව ද වැටුප් ක්‍රමයේ පවතින දුර්වලතා හේතුවෙන් එම නිලධාරීන් සේවයේ රඳවා ගැනීමට නොහැකි වීම දෙපාර්තමේන්තුව මුහුණ පා ඇති තවත් අභියෝගයකි.

ඉදිරි ඉලක්ක

මෙම දෙපාර්තමේන්තුවේ විශේෂ ලක්ෂණය වන්නේ, එයටම සීමා වූ වැඩසටහනක් නොතිබීමයි. අමාත්‍ය මණ්ඩලය විසින් නියමිත ප්‍රතිපත්ති අනුමත කිරීමෙන් පසුව, ආණ්ඩුවේ අමාත්‍යාංශවල හා එම අමාත්‍යාංශ යටතේ ඇති විවිධ දෙපාර්තමේන්තුවල ව්‍යවස්ථා සම්පාදන අවශ්‍යතා මත දෙපාර්තමේන්තුවේ වැඩසටහන සකස් වීම ඊට හේතුවයි. එබැවින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය, යම් නිශ්චිත වර්ෂයක් මුළුල්ලේ ප්‍රාථමික නීති සංශෝදන හා උපකාරක නීති සම්බන්ධයෙන් අදාල රේඛීය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හා එම ඉල්ලීම් සාර්ථකව නිම කිරීම යන පදනම මත සකස් වී ඇත. දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වන නීති සම්පාදනයෙහි විෂය පථයට ඇතුළත් වන කවර ආකාරයක හෝ වූ නීති, එය ඉල්ලා සිටින අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට මුදා හැරීමට පෙර භාෂා තුනෙන්ම සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

ඉහත දක්වා ඇති කරුණු වලට අමතරව, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීම අනිවාර්යයෙන් සිදු කළ යුතු අතර එය සිදුකරනු ලැබිය හැකි ආකාරය නිශ්චිතව දක්වමින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත. වරින් වර ඒ සම්බන්ධයෙන් විමසිම් සිදු කරයි.

(අ) දැනට නීති කෙටුම්පත් සම්පාදක ඇතුළුව දෙපාර්තමේන්තුවේ විවිධ තනතුරුවල නීති කෙටුම්පත් සම්පාදනයේ නියුතු නිලධරයන් සඳහා මුළු අනුමත සේවක සංඛ්‍යාව හතළිහක් (40) වන අතර, අමාත්‍යාංශ සහ රාජ්‍ය අමාත්‍යාංශ වැඩි වීමත් සමග නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන්ගේ වැඩ ප්‍රමාණය වැඩි වී ඇත. එබැවින් සමස්ත නීති කෙටුම්පත් සම්පාදනයේ නියුතු නිලධරයන් සංඛ්‍යාව එකසිය දහතර (114) වන පරිදි පවතින සේවක සංඛ්‍යාව හැත්තෑ හතරකින් (74) වැඩි කිරීමට යෝජනා කෙරේ. මෙසේ බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම ඇතුළුව විශේෂිත පියවර ගතයුතු බව සැලකිය යුතු ය.

(ආ) සංවෘත දෙපාර්තමේන්තුගත සේවයක මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන භාෂා පරිවර්තකයන්, සංස්කාරකවරුන් සහ ලේඛන සහකාරවරුන් විසින් ඉටු කරනු ලබන කාර්යවල විශේෂ සහ ඉහල තාක්ෂණික ස්වභාවය සලකා බලමින්, ඔවුන් දෙපාර්තමේන්තුවේ සේවයේ රඳවා තබා ගැනීම සඳහා පියවර, ඉහත යෝජනාව තුළ යෝජනා කරනු ලැබ ඇත.

ගණන් දීමේ නිලධාරී/ ආයතන ප්‍රධානියා

නම් : දිල්රුක්ෂි සමරවීර
ජනාධිපති නීතිඥ,
නීති කෙටුම්පත් සම්පාදක,
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව,
අංක. 80, අධිකරණ මාවත,
කොළඹ 12.

තනතුර :

දිනය : 2023/09/20

03 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

3.

ඒසිඒ-එල්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	කළඹ 2022 රු.	2021 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අයිතම		130,846,000	120,052,000	ඒසිඒ-3
-	කැන්පතු		39,310	28,725	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		6,022,124	4,998,650	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**136,907,434**	**125,079,375**	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්				
-	**නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		136,907,434	125,079,375	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		6,020	14,636	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්				
	නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**136,901,414**	**125,064,739**	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
101,650,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	100,311,266	94,852,480	
33,345,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	31,582,085	20,532,834	ඒසිඒ-2(ii)
685,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	616,461	561,112	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
135,680,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**132,509,812**	115,946,426	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	
100,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	53,000	5,194,442	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
1,000,000	හැකියා වර්ධනය	14	632,890	600,000	
50,000	වෙනත් මූලධන වියදම්	15	-	28,800	
1,150,000	**මුළු මූලධන වියදම් (උ)**		**685,890**	5,823,242	
	කැන්පතු ගෙවීම්		46,360	21,675	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		4,597,162	5,186,232	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		4,643,522	5,207,907	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**137,839,224**	**126,977,575**	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(937,810)	(1,912,836)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**(937,810)**	**(1,912,836)**	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		2022	2021
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	100,411,680	103,024,723
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	11,995,560	13,420,522
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**112,407,240**	**116,445,245**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		11,995,560	13,413,472
දේපළ පිරියත හා උපකරණ සංචිතය		100,411,680	103,024,723
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	-	7,050
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**112,407,240**	**116,445,245**

පිටු අංක7 සිට 25 දක්වා ඒසීඒ 2 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 26 සිට 31 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළදිරවි කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරි
නම :	නම : දිල්රුක්ෂි සමරවීර	
තනතුර :	තනතුර : නීති කෙටුම්පත් සම්පාදක	
දිනය : 2023/02/23	දිනය : 2023.02.23	දිනය : 2023.02.23
එසනිතා පේරේරා	නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව	නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
ලේකම්	කොළඹ - 12.	කොළඹ 12
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය		
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.		

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	4,414,284	3,885,466
අග්‍රිම් ලැබීම්	130,846,000	120,052,000
අත්තිකාරම් අයකර ගැනීම්	5,940,029	4,709,594
තැන්පතු ලැබීම්	39,310	28,725
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**141,239,623**	**128,675,785**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	131,650,236	114,737,331
සහනාධාර සහ මාරුකිරීම්	616,461	561,112
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	4,350,642	2,874,445
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම්	6,020	14,636
අත්තිකාරම් ගෙවීම්	4,597,162	5,182,932
තැන්පතු ගෙවීම්	46,360	21,675
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**141,266,881**	**123,392,131**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**(27,258)**	**5,283,654**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	543,683	539,588
ලාභාංශ	-	-
භූමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	169,465	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**713,148**	**539,588**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	685,890	5,823,242
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මූළු මුදල් ප්‍රවාහය (ඉ)	**685,890**	**5,823,242**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**27,258**	**(5,283,654)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මූළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මූළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත.අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනියහැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාළ නොවේ					

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය.

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් ප්‍රතිපාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක්(%) ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසන් ප්‍රතිපාදනය		
පුනරාවර්තන වියදම්	135,680	135,680	132,510	98%
ප්‍රාග්ධන වියදම්	1,150	1,150	686	60%

3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදනය ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් ප්‍රතිපාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක්(%) ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
01.	නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව	ජලය ,විදුලි, ආරක්ෂක හා ඉන්ධන බිල්පත් සඳහා	1,733	1,846	1,638	89%

02.	අධිකරණ අමාත්‍යාංශය - සමථ මණ්ඩල කොමිෂන් සභාව	ජලය ,විදුලි, ආරක්ෂක හා ඉන්ධන බිල්පත් සඳහා	819	930	766	82%
03.	අධිකරණ අමාත්‍යාංශය - ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය	ජලය ,විදුලි, ආරක්ෂක හා ඉන්ධන බිල්පත් සඳහා	1,140	1,340	1,175	88%
04.	රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	නවක පත්වීම්ලාභී සංවර්ධන නිලධාරීන්ගේ වැටුප් ගෙවීම	561	561	561	100%
05.	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	ණය ශේෂ නිරවුල් කිරීම	211	211	211	100%

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152 – 2.1	වාහන	59,495,000.00	59,495,000.00	-	100%
9152	යන්ත්‍රෝපකරණ	40,916,680.31	40,916,680.31	-	100%
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කරමින් පවතින වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } JLO/B/LDD/FA/2022/05 ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2023 මැයි 24 දින

නීති කෙටුම්පත් සම්පාදක

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

ශීර්ෂය 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 231 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවධානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

20 – 02 – 02 – 99 වෙනත් ආදායම් සංකේතය යටතේ වූ රු.543,683 ක් වූ ආපදා ණය පොළී ආදායම මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම යටතේ දැක්විය යුතු වුවත් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණි.

1.6.2 පුනරාවර්තන වියදම්

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ මුදල් වැය කිරීම් යටතේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතේ දැක්විය යුතු රු.632,890 ක් වූ හැකියා වර්ධනය සඳහා දරන ලද වියදම අයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ භෞතික වත්කම් ඉදිකිරීම හා මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කරගැනීම යටතේ දක්වා තිබීම හේතුවෙන් පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.3 මූලධන වියදම්

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ මුදල් වැය කිරීම් යටතේ භෞතික වත්කම් ඉදිකිරීම් හා මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කරගැනීම් යටතේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම් වටිනාකම රු.53,000 ක් වුව ද, රු.685,890 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 632,890 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.4. අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.5 ඡේදය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ශේෂය, අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය සහ වසර අවසානයේ අග්‍රිම ශේෂයේ එකතුවට සමාන විය යුතු වුව ද, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දෙසැම්බර් 31 දිනට රු.6,020 ක් වූ අග්‍රිම ශේෂය දක්වා නොතිබුණි.

1.6.5 මූල්‍ය නොවන වත්කම්

(අ) 2021 දෙසැම්බර් 31 දිනට වාහන වටිනාකම රු. 59,975,000 ක් වුව ද, එය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු.53,700,000 ක් ලෙස ඉදිරියට ගෙනවිත් තිබුණි. වර්ෂය තුළ

රු.6,275,000 ක වාහන අපහරණය කර තිබුණ ද, එය ඒසීඒ 6 ආකෘතියට ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2021 දෙසැම්බර් 31 දිනට යන්ත්‍ර හා උපකරණ වටිනාකම රු. 43,049,723 ක් වුව ද, එය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු.40,863,680 ක් ලෙස ඉදිරියට ගෙනවිත් තිබුණි. වර්ෂය තුළ රු.2,186,043 ක යන්ත්‍ර හා උපකරණ අපහරණය කර තිබුණ ද, එය ඒසීඒ 6 ආකෘතියට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) වර්ෂය තුළ රු. 53,000 කට මිලදී ගත් යන්ත්‍ර හා උපකරණ වටිනාකම ඒසීඒ 6 ආකෘතියේ මිලදී ගැනීම් යටතට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 427 (3) ප්‍රකාරව ඉහත (අ), (ආ), (ඇ) හි වෙනස්කම් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

1.6.6 අග්‍රිම ශේෂය

2022 දෙසැම්බර් 31 දිනට ඒසීඒ - 3 හි භාණ්ඩාගාර පොත් අනුව අග්‍රිම ශේෂය රු.6,020 ක් ලෙස දක්වා තිබුණ ද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එය මාර්ගස්ථ මුදල් ලෙස මූල්‍ය වත්කම් යටතේ ද, අග්‍රිම ශේෂය ලෙස ජංගම වගකීම් යටතේ දක්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) එක් මූලධන වැය විෂයයක් සඳහා වූ රු.50,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) 2022 අප්‍රේල් 26 දිනැති 03/2022 අංක දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3 (xvii) ඡේදය ප්‍රකාරව වර්ෂය තුළ වියදම් දැරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් ඇත්නම් ඒවා වර්ෂය අවසන් වීමට පෙර වෙනත් වියදම් සඳහා යොදවා නොගත යුතු වුවත්, වැය විෂයයන් 04 ක රු.2,927,000 ක් වූ ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

(ඇ) පුනරාවර්තන වැය විෂයයන් 02ක් හා මූලධන වැයවිෂයයන් 02ක් සඳහා ප්‍රතිපාදන රු.3,140,000 කින් රු.1,030,071ක් ඉතිරිවී තිබූ අතර, එම ඉතිරිවීම් සියයට 25 සිට සියයට 47 දක්වා පරාසයක් ගෙන තිබුණි.

(ආ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 01 ඡේදය	දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම 2018 වර්ෂයේ පටන් සිදුකළ යුතු වුවත්, මේ දක්වා කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි	
i. මුදල් රෙගුලාසි 1645 (අ)	• මාසික ගමන් සාරාංශය මාසිකව ලොග් සටහන් පොත්වල ඇතුළත් කළ යුතු වුවත් වාහන 09 කට අදාළව එසේ කර නොතිබුණි. • වාහන 02 කට අදාළව අලුත්වැඩියා කිරීම් ලොග් පොත්වල ඇතුළත් කර නොතිබුණි. • වාහන අනතුරු දෙකක් පිළිබඳව ලොග් පොත්වල සටහන් කර නොතිබුණි.
(ඈ) 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.3 ඡේදය	තැන්පත් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය 2023 පෙබරවාරි 28 දිනට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, 2023 මැයි 23 දින ඉදිරිපත් කර තිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

රු. 19,775 ක් වටිනා බැරකම් 2022 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ අඩුවෙන් දක්වා තිබුණි.

2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.1.2 (අ) ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි. අ

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2016 දෙසැම්බර් 31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 හි 3.1 ඡේදය	වාහන 10 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

3.1.1 සැලසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 03 ඡේදය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කර ප්‍රවර්ථන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත 2022 ජනවාරි 13 දින ඉදිරිපත් කර තිබුණි.

3.1.2 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගත වීමට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ඉදිරිපත් කළ යුතු වුවත්, 2021 වර්ෂයට අදාළ වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2022 අගෝස්තු 10 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි.

(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙල කළ යුතු වුවත්, විගණනය වෙත ඉදිරිපත් කළ කාර්ය සාධන වාර්තාව ඒ අනුව පිළියෙල කර නොතිබුණි.

(ඇ) 2022 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර ඇති කාර්ය සාධන වාර්තාව අනුව 2022 ජනවාරි 01 දිනට පැවති නිරීක්ෂණ හා උපදෙස් අපේක්ෂාවෙන් ඉදිරිපත් කළ ඉල්ලීම් 440 න් කෙටුම්පත් 105 ක් දීර්ඝ කාලීනව උපදෙස් නොමැතිව වසන ලද ගොනු විය.

(ඈ) 2022 දෙසැම්බර් 31 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් 100 ක ප්‍රමාණයක් ඉතිරි වී පැවතුණි.

3.2 ප්‍රසම්පාදනයන්

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ) වගන්තිය ප්‍රකාරව ඊළඟ එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එසේ පිළියෙල කර නොතිබුණි.

3.3 පාඩු හා හානි

මුදල් රෙගුලාසි අංක 103 (1) (ඉ) ප්‍රකාරව රු.625,286 ක් වටිනා හානිවීම් 05 ක් හානි පාඩු ලේඛනයෙහි සටහන් කර නොතිබුණි.

4. යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 40 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි. අධිකරණ අමාත්‍යාංශය විසින් 2022 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර තිබුණ ද, අභ්‍යන්තර විගණන අංශය මඟින් අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස්කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 149 ක් වුව ද, තථ්‍ය කාර්ය මණ්ඩලය 93 ක් වූයෙන් නිලධාරීන් 56 ක සේවක පුරප්පාඩුව පැවතුණු අතර එය සමස්ත කාර්ය මණ්ඩලයෙන් සියයට 38 ක ප්‍රමාණයකි.

(ආ) නීති කෙටුම්පත් සම්පාදනය අරමුණු කරගත් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සඳහා ඍජුව දායකත්වය ලබා දෙනු ලබන ජ්‍යෙෂ්ඨ හා තෘතීයික මට්ටමේ තනතුරු 11 න් තනතුරු 04 ක් සඳහා පුරප්පාඩු 31 ක් පවතින නමුත්, මේ සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම පුරප්පාඩු සංඛ්‍යාව අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 49 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

ආර්.එස්. කටුගම්පල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක						අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
						100% - 90%	75% - 89%	50% - 74%
රාජකාරියේ ස්වභාවය	ලැබී ඇති ඉල්ලීම් (පසුගිය වර්ෂයේ අවසන් නොවූ ඉල්ලීම් ද ඇතුළත්ව)	2022.12.31 දිනට කෙටුම්පත් සකස් කර භාෂාත්‍රයෙන් අදාළ පාර්ශ්වයන් වෙත ලබා දුන් සංඛ්‍යාව (කිහිපවරක් භාෂාත්‍රෙයන් සකස් කර අදාළ පාර්ශ්වයන් වෙත භාරදුන් අවසන් කෙටුම්පත්වල ඒ ඒ වාරයන් සියල්ලම මෙහි ඇතුළත් වේ.)	දීර්ඝ කාලීනව උපදෙස් නොමැතිව වසන ලද ගොනු	2022.12.31 දිනට කෙටුම්පත් කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් හාරදී නීතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තු වෙන් ඉතිරිව පවතින ඉල්ලීම් සංඛ්‍යාව	2022.12.31 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව	දෙපාර්තමේන්තුව විසින් අවධානය යොමුකර සම්පූර්ණ කරනු ලැබ කෙටුම්පත් යවනු ලැබුවාවූ ඉල්ලීමක්,ප්‍රධාන වශයෙන් උපදෙස් ලබාදෙනු ලබන නියෝජ්‍යායතන විසින් තම ප්‍රතිපත්තිය නිරන්තරයෙන් වෙනස් කිරීමේ හේතුව මත,තවදුරටත් වූ සංශෝධන සඳහා අලුත් උපදෙස් ද සමග ඉදිරිපත් කරනු ලැබේ. එසේ වුවද එවැනි ඉල්ලීමක් ලැබුන විට එම ඉල්ලීමට අදාළ කෙටුම්පත අවසාන වශයෙන් සකස් කර තිබීම නොසලකා අලුතින් සිදුකරනු ලබන ඉල්ලීමක් සඳහා මෙන් එම ඉල්ලීම පිළිබඳව නැවත අවධානය යොමු කිරීමට හා කාලය වැය කිරීමට මෙම දෙපාර්තමේන්තුවට සිදු වේ. තවද, සම්පූර්ණ කරන ලද කෙටුම්පත් සඳහා එවැනි සංශෝධන සිදුකිරීමට කරනු ලබන ඉල්ලීම් අවසාන කෙටුම්පත භාෂාත්‍රයෙන් යවනු ලැබීමෙන් පසුව ද සිදු කරනු ලබන අතර ඇතැම්විට එම කාර්ය පටිපාටිය නැවත නැවතත් වාර ගණනක් ඉටු කිරීමට සිදුවේ.
පනත් කෙටුම්පත් කිරීම (මූලික හා සංශෝධන නීති)	298	53	79	135	31			
පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත්	50	10	0	28	12			
උපකාරක නීති ප්‍රතිශෝධනය	416	210	26	123	57			
පළාත් සභා ප්‍රඥප්ති	11	0	0	11	0			

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
16.1			ලැබී ඇති ඉල්ලීම් අනුව ඉටු කර ඇත.		
16.2					
16.3					
16.4					
16.5					

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

තිරසර අරමුණු අනුව කටයුතු කරනු ලබන අතර, උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායිතාව ලබා ගැනීමට හැකි අයුරින් දෙපාර්තමේන්තුව විසින්, ආණ්ඩුවේ විවිධ අමාත්‍යාංශවලින් ඉදිරිපත් කරන නව නීති පැනවීම සඳහා පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම, පවත්නා නීති සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම සහ උපකාරක නීති ප්‍රතිශෝධනය කිරීම සිදුකර ඇත. පනත් කෙටුම්පත් සමාලෝචනය කිරීම සඳහා වන පාර්ලිමේන්තු තේරීම් කාරක සභා රැස්වීම්වලට සහභාගීවීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේදී පාර්ලිමේන්තුව සමග සම්බන්ධීකරණය පවත්වා ගැනීම වැනි අවශ්‍ය කටයුතු කිරීම ද නිසි පරිදි ඉටු කර ඇත.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	**42**	**25**	**17**
තෘතීය	**28**	**11**	**17**
ද්විතීය	**55**	**37**	**18**
ප්‍රාථමික	**24**	**20**	**04**

6.2

දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය භාරය කිරීම සඳහා වන අනුමත සේවක සංඛ්‍යාව 149 කි. එසේ වුවද, එකී කටයුතු ඉටු කිරීම සඳහා 2022 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ තත්‍ය සේවක සංඛ්‍යාව වූයේ 93 දෙනෙකු පමණි. පහත දක්වා ඇති පරිදි, විවිධ සේවා ගණුවල සේවා නියුක්තිය සම්බන්ධයෙන් පුරප්පාඩු 56ක් පවතියි. මෙම පුරප්පාඩු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනයට සෘජුවම බලපානු ලබන හෙයින් එකී බලපෑම් අවම කිරීම සඳහා පහත දැක්වෙන පියවර ගෙන ඇත.

<u>ජ්‍යෙෂ්ඨ මට්ටම</u>

(අ) 2022.12.31 දිනට නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක තනතුරු 03ක් පුරප්පාඩුව පවති.

(ආ) ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරෙහි පුරප්පාඩු 08 ක් පවතියි. අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව, එකී පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා දැනට සේවයේ යෙදී සිටින සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරුන් විසින් එකී නියමිත වසර දහයක සේවා කාලය සම්පූර්ණ කළ යුතු වන අතර 2021.02.21 දිනට සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරුන් 14 දෙනෙකු එම සුදුසුකම් සම්පූර්ණ කර ඇත. ඒ අනුව අදාළ පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතියි.

(ඇ) සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරෙහි පුරප්පාඩු 06 ක් පවතියි. එම තනතුරුවල පුරප්පාඩු පිරවීමට අදාළ අනුමතය කඩිනමින් ලබා දෙන ලෙස 2022.11.17 දිනැති ලිපියෙන් අධිකරණ අමාත්‍යාංශය මගින් මුදල් අමාත්‍යාංශය වෙතින් ඉල්ලා ඇත. එම ඉල්ලීම අග්‍රාමාත්‍ය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් යුත් රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් වන කමිටුව වෙත ඉදිරිපත් කළ බව අධිකරණ අමාත්‍යාංශ ලේකම්ගේ 2022.11.29 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත.

(ඇ) සහකාර අධ්‍යක්ෂ තනතුරේ සේවය කරන ලද නිලධාරිනිය ස්ථාන මාරු සඳහා ඉල්ලීම් කරන ලද අවස්ථාවලදී සුදුසු අනුප්‍රාප්තිකයෙකු ලබා දෙන ලෙස 2022.06.10 සහ 2022.12.01 දිනැති ලිපි මගින් අධිකරණ අමාත්‍යාංශය මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දී ඇත.

<u>තෘතීය මට්ටම</u>

(අ) 2022.12.31 වන දිනට ප්‍රධාන භාෂා පරිවර්තක තනතුරක් සහ භාෂා පරිවර්තක තනතුරු 16 ක් පුරප්පාඩුව පවතියි. එනම්, ඉංග්‍රීසි/ සිංහල භාෂා පරිවර්තක තනතුරු 08 ක් සහ ඉංග්‍රීසි/ දෙමළ භාෂා පරිවර්තක තනතුරු 08 ක් වේ. මෙම තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීමට කඩිනමින් අවශ්‍ය අනුමතය ලබා දෙන ලෙස ඉල්ලමින් 2022.11.25 දිනැති සිහිකැඳවීමේ ලිපිය අධිකරණ අමාත්‍යාංශය මගින් මුදල් අමාත්‍යාංශය වෙත යවා ඇත. වැටුප් ක්‍රමයෙහි ඇති විෂමතා හේතුවෙන් මෙම තනතුරෙහි රඳවා ගැනීම අසීරු වී ඇත. එබැවින් මෙම තනතුරට අනුමත වැටුප් පරිමාණය සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. එලෙසම වසරක කාලයක් සඳහා භාෂා පරිවර්තනය පිළිබඳ උපාධිධාරීන් 07 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇත.

<u>ද්විතීයික මට්ටම</u>

(අ) 2020.04.14 දින සිට ද්විතීක පුස්තකාලයාධිපති තනතුර පුරප්පාඩුව පවතී. 2022.06.22 හා 2022.09.26 දිනැති ලිපි මඟින් මෙම පුරප්පාඩුව පිළිබඳව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර ඇත.

(ආ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුර සඳහා සුදුසු නිලධරයෙකු පත් කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කර දෙන ලෙස 2022.09.28 දිනැති ලිපියෙන් අධිකරණ අමාත්‍යාංශය මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇත.

(ඇ) 2022.12.31 දිනට කළමනාකරන සේවා නිලධාරි තනතුරෙහි පුරප්පාඩු 02 ක් පවතී. අධිකරණ අමාත්‍යාංශ ලේකම්ගේ 2020.08.25 දිනැති ලිපිය මගින් අවසන් වරට මෙම පුරප්පාඩුව පිළිබඳව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර ඇත.

(ඈ) 2022.12.31 වන දිනට ලේඛන සහකාර තනතුරෙහි පුරප්පාඩු 09 ක් ද, සංස්කාරක තනතුරෙහි පුරප්පාඩු 06 ක් ද පවතියි. අයදුම්පත් කැඳවා අවසන් කර ඇතත්, අයවැය චක්‍රලේඛ 03/2022 හේතුවෙන් බඳවා ගැනීම් තාවකාලිකව නතර කර ඇත. මෙම තනතුරේ බඳවා ගැනීම් පිළිබඳව රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් වන කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස දන්වමින් 2022.12.05 දිනැති ලිපිය අධිකරණ අමාත්‍යාංශය වෙත යවා ඇත. දුර්වල වැටුප් ක්‍රමය හේතුවෙන් මෙම නිලධරයන් සේවයෙහි රඳවා ගැනීම දුෂ්කර වී ඇත.

ප්‍රාථමික මට්ටම

(අ) රියදුරු තනතුරේ පුරප්පාඩු 2 ක් පවතී. මේ සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කර ඇත. අධ්‍යක්ෂ ජනරාල්, බහුකාර්ය සංවර්ධන කාර්ය සාධන බලකා දෙපාර්තමේන්තුව අමතන ලද අධිකරණ අමාත්‍යාංශයේ MOJ/E08/03/05/2015 හා 2021.12.18 දිනැති ලිපිය මගින් මෙම තනතුරේ පුරප්පාඩු පිරවීමට කඩිනමින් කටයුතු කරන ලෙස ඉල්ලා ඇත. 2022.03.23 දින මෙම දෙපාර්තමේන්තුවේ සේවයට වාර්තා කරන ලද බහුකාර්ය සංවර්ධන කාර්ය සාධන බලකා සහායකයකු මගින් එක් පුරප්පාඩුවක් ආවරණය කර ඇත.

(ආ) කාර්යාල සේවක සේවය තනතුරේ පුරප්පාඩු 2 ක් පවතී. බහුකාර්ය සංවර්ධන කාර්ය සාධන සහායකයකු මේ සඳහා ලබා දෙන ලෙස 2022.01.27 දිනැති ලිපිය මගින් අධිකරණ අමාත්‍යාංශ ලේකම් වෙතින් ඉල්ලා ඇත. 2022.03.22 දින මෙම දෙපාර්තමේන්තුවේ සේවයට වාර්තා කරන ලද බහුකාර්ය සංවර්ධන කාර්ය සාධන සහායකයකු මගින් එක් පුරප්පාඩුවක් ආවරණය කර ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කළ කාර්ය මණ්ඩල සංඛ්‍යාව	වැඩසටහන පැවති කාලසීමාව	මුළු ආයෝජනය (රු'000)		වැඩසටහන් ස්වභාවය (විදේශීය/ දේශීය)	ලබාගත් ප්‍රතිඵලය/ දැනුම
			දේශීය	විදේශීය		
සයිබර් අපරාධ වැළැක්වීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීමේදී කාන්තාවන්ගේ කාර්යභාරය ප්‍රවර්ධනය කිරීම පිළිබඳ වැඩමුළුව - කොස්ටාරිකාව	01	2022 නොවැම්බර් 10, 11 දිනවල		එ.ජ. ඩොලර් 280	විදේශීය	
නීතිය පිළිබඳ ආචාර්ය උපාධි පාඨමාලාව	02	අවුරුදු 01	රු. 500,000 .00 (රු. 250,000.00 x 2)	-	දේශීය	
රජයේ වාහන නඩත්තුව පිළිබඳ පුහුණු වැඩසටහන	01	දින 01 2022 මාර්තු 15 වන දින	රු.5,000.00	-	දේශීය	අදාළ විෂයය භාර නිලධරයාගේ දැනුම වර්ධනය කිරීම. මෙය දෙපාර්තමේන්තුවේ කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීමට උපකාරී වේ.
Public Sector Salary Payment පුහුණු වැඩසටහන	01	දින 01 2022 ජුනි 09 වන දින	රු.5,000.00	-	දේශීය	අදාළ විෂයය භාර නිලධරයාගේ දැනුම වර්ධනය කිරීම. මෙය දෙපාර්තමේන්තුවේ කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීමට උපකාරී වේ.

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)			
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	මෙම ගිණුම් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට අදාළ නොවේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්			
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්නවාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගනන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.5	සියළුම මාසික ගිනුම් සාරාංශ (CIGAS) පිලියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රේ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		

4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොමැත. අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් විගණන කටයුතු ඉටු කරයි.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේනතුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණනය**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොමැත. අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් විගණන කටයුතු ඉටු කරයි.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		

6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උපවගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොමැත. අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් විගණන කටයුතු ඉටු කරයි.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගනන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම			
7	**විගණන හා කළමනාකරන කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තබීම	අනුකූල වේ		

8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය කිරීම**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරනය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		

10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් අතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදනය හා උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිලිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට අදාළ අත්තිකාරම් ගිණුමෙහි හිඟ හිටි ණය ශේෂ කිසිවක් නොමැත.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම			
13	**පොදු තැන්පත් ගිණුම්**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට අදාළ පොදු තැන්පතු ගිණුමෙහි කල් ඉකුත් වූ තැන්පතු නොමැත.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිනුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			

14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15.	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම			
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට ආදායම් ගිණුම අදාළ නොවේ.		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබී			
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අදාළ නොවේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අදාළ නොවේ		
19	**මානව සම්පත් සංවර්ධන සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		

19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ	කාර්ය මණ්ඩලය වෙත අවශ්‍ය පුහුණු ලබා දී ඇත.	
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල නොවේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින්පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		